# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2447/05 – 2025 ජූලි මස 28 වැනි සඳුදා – 2025.07.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2019/308.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2022.07.27 වැනි දින අංක 2290/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.06.29 වැනි දින දරන නියෝගයෙන්,

ෆ්ලයිට් ඇටෙන්ඩන්ට්ස් යූනියන්, තට්ටු නිවාස 13, බෝගල කෝට්, ඩික්මන්ස් පාර, කොළඹ 05.

සහ

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, 3 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

අතර පවත්නා 2022.06.27 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ආර්. නවෝදයම් මහතා වෙත යොමු කරන ලදී.

1A – G 044965 – 09 (2025/07)

බේරුම්කරු නීතිඥ ආර්. නවෝදයම් මහතා මෙම ආරාවුලෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2022.06.29 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 03 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 – 0327/1

---

මගේ අංකය: IR/COM/04/2019/308.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ෆ්ලයිට් ඇටෙන්ඩන්ට්ස් යූනියන්, නො. 01, ජයකොන්ත පටුමඟ, කිරුළ පාර, කොළඹ 05.

සහ

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, 3 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, සීදුව, ලියනගේමුල්ල, HPT ප්‍රධාන පාර,31/1, නීතිඥ සී.ඒ.එච්.එම්. විජේරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2019/308.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ෆ්ලයිට් ඇටෙන්ඩන්ට්ස් යූනියන්, නො. 01, ජයකොන්ත පටුමඟ, කිරුළ පාර, කොළඹ 05.

සහ

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, 3 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් ආයතනයේ ෆ්ලයිට් ඇටෙන්ඩන්ට්ස් යූනියන් සංගමය නියෝජනය කරන ගුවන් කාර්ය මණ්ඩල සේවකයින්ගේ සේවා නියුක්තියේ කොන්දේසියක් වශයෙන් සඳහන් අනියම් හා අසනීප නිවාඩු භුක්ති විඳීමට ඇති අයිතිය අහිමි කර තිබේ ද එමඟින් සේවකයින්ට අසාධාරණයක් සිදුවී තිබේ ද එසේ නම් ලැබිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූනි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 – 0327/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.